# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1801/38 - 2013 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2013.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(ඩ) වගන්තිය ප්‍රකාර සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, පනවනු ලබන නියෝගය.

පියංකර ජයරත්න,
සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2013 මාර්තු මස 14 වැනි දින,
කොළඹ 02.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල ගගන නාවික සේවා ගාස්තු රෙගුලාසි 2013 අංක 1 වශයෙන් හඳුන්වනු ලැබේ.

2. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි ලිඛිතව නිදහස් නොකරන්නේ නම්,

(අ) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල වෙත පැමිණෙන හා ඉන් පිටත්ව යන ජාත්‍යන්තර වාණිජ ගුවන් සේවා මෙහෙයුම් කටයුතු සිදුකරන සෑම ගුවන් යානයක්ම පහත දැක්වෙන ගොඩබෑසීම් ගාස්තු සහ නැවතුම් ගාස්තු ව්‍යවස්ථාපිත සේවා සපයන්නා වෙත ගෙවිය යුතු ය:–

| | | |
|---|---|---|
| 01 | ගොඩබෑසීම් ගාස්තු | එක් ගොඩබෑසීමක් සඳහා එක්සත් ජනපද ඩොලර් 250ක අවමයකට යටත්ව ගුවන් යානයේ උපරිම ඉගිලුම් බරින් සෑම මෙට්‍රික් ටොන් 1කටම සහ ඉන් කොටසකට එක්සත් ජනපද ඩොලර් 4 බැගින් |
| 02 | නැවතුම් ගාස්තු | ගොඩබෑසීමෙන් පසු ප්‍රථම පැය 3ක කාලයකට වැඩමනත් වන සෑම පැය 6ක කාල සීමාවක් සහ ඉන් කොටසක් සඳහා අදාල ගොඩ බෑසීමේ ගාස්තුවෙන් 10%. |

(ආ) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල වෙත පැමිණෙන හා ඉන් පිටත්ව යන අභ්‍යන්තර වාණිජ ගුවන් සේවා මෙහෙයුම් කටයුතු සිදුකරන සෑම ගුවන් යානයක්ම පහත දැක්වෙන ගාස්තු ව්‍යවස්ථාපිත සේවා සපයන්නා වෙත ගෙවිය යුතු ය :–

| | | |
|---|---|---|
| 01 | ගොඩබෑසීම් ගාස්තු | එක් ගොඩබෑසීමක් සඳහා රු. 2500ක අවමයකට යටත්ව, ගුවන් යානයේ උපරිම ඉගිලුම් බරින් සෑම මෙට්‍රික් ටොන් 1කටම හෝ ඉන් කොටසකට රු. 200 බැගින් |
| 02 | නැවතුම් ගාස්තු | ගොඩබෑසීමෙන් පසු ප්‍රථම පැය 3ක කාලයකට වැඩිමනත් වන සෑම පැය 6ක කාල සීමාවක් සහ ඉන් කොටසක් සඳහා අදාල ගොඩබෑසීමේ ගාස්තුවෙන් 10% |

3. ඉහත 2(අ) ඡේදයෙහි කුමක් සඳහන් වුව ද, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල තුළට හා ඉන් පිටතට මෙහෙයුම් සිදු කරන සියළුම ජාත්‍යන්තර ගුවන් සමාගම් වෙත, අදාල ගොඩබෑසීම් ගාස්තු, නැවතුම් ගාස්තු සහ බිම් මෙහෙයුම් ගාස්තු සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් වට්ටම් ප්‍රදානය කරනු ලැබේ:–

| *ගාස්තු වර්ගය* | *සාමාන්‍ය ගාස්තු සඳහා අදාල වන වට්ටම් අනුපාතය* | | | | |
|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| ගොඩබෑසීම් සහ නැවතුම් ගාස්තු | 50% | 25% | 25% | 25% | 25% |
| බිම් මෙහෙයුම් ගාස්තු | 60% | 50% | 40% | 40% | 40% |

03-1153

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.